# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2209/44 - 2021 ජනවාරි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2021.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

### අංක 04/2021 දරන සුරාබදු නිවේදනය

සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 32 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින් මෙම නිවේදනය, 2018 ජනවාරි මස 18 වැනි දින අංක 2054/41 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද අංක 03/2018 දරන සුරාබදු නිවේදනයේ උපලේඛනයේ අංක 2 හි දැක්වෙන රා තැබෑරුම් විවෘත කරනු ලබන හා වසනු ලබන වේලාවන් 2021 ජනවාරි 07 වැනි දින සිට ක්‍රියාත්මක වන ලෙස පහත උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

2020 ජූනි මස 13 දිනැති අංක 2075/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 11/2018 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|---|
| | *බලපත්‍ර වර්ගය* | *විවෘතව තැබිය යුතු වේලාවන්* |
| 2. | (i) රා තැබෑරුම් | පෙ.ව. 10.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 9.00 දක්වා |
| | (ii) රා තැබෑරුම් (සමූපකාර ක්‍රමය යටතේ ක්‍රියාත්මක) | පෙ.ව. 8.00 සිට ප.ව. 9.00 දක්වා |

02. අර්ථ නිරූපණය : "සමූපකාර ක්‍රමය යටතේ" යන්න පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමූපකාර සමිති හෝ සංගම් අදහස් වේ.

01 - 557

1A - PG 5265 — 600 (2021/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*